# සිල්වරීන් ආයතනයේ මඟපෙන්වීම හා දිරිදීම නිසා සාර්ථක කුඩා ව්‍යාපාරක හිමිකාරිනියක් බවට පත්වූ ආදරණීය ගෘහණිය

අපරටේ ග්‍රාමීය ප්‍රජාව, නව ව්‍යවසායකත්වයක් සඳහා මැලිකමක් දක්වන බව පෙනෙන්නට තිබේ. ග්‍රාමීය ගෘහණිය තුල මෙම ලක්ෂණය විශේෂයෙන් ඉස්මතු වී පෙනේ. නව ව්‍යවසායකත්වයන් ආරම්භ කලද එය අතරමග නවතා දැමීම පෙනෙන්නට තිබෙන විශාල ගැටළුවකි. කළාතුරකින් වුවද උත්සහයෙන් ස්වයංරැකියා හා ව්‍යාපාර පවත්වාගෙන යන ගැමියන් හා ගෘහණියන් අපට දක්නට ලැබේ. විශේෂයෙන්ම ස්වයංරැකියා හා ව්‍යාපාර පවත්වාගෙන යන ගෘහණියන් රටට දක්වන දායකත්වය හා පෙන්වන ආදර්ශය ඉතා වැදගත්. ග්‍රාමීය ව්‍යවසායක ගෘහණිය යනු සංකල්පයක් පමණක් නොව සැබවින්ම ප්‍රවර්ධනය කල හැකි යථාර්ථයකි. ඒ සඳහා ඔවුනට නිසි මඟපෙන්වීම හා සමීප දිරිදීම අත්‍යවශ්‍යයි. මෙම ලිපියෙන් දැක්වෙන්නේ එවැනි මඟපෙන්වීමක් හා දිරිදීමක් හේතුවෙන් සාර්ථක කුඩා ව්‍යාපාරක හිමිකාරිනියක් බවට පත්වූ ආදරණීය ගෘහණියක පිළිබඳ විස්තරයයි.



ගලිගමුව ඇටිකීරියගොල්ල ප්‍රදේශයේ පදිංචි ඉනෝකා දිසානායක මහත්මිය, තම සැමියා සහ දරුවන් දෙදෙනාගේ කටයුතුවල නිරත ආදරණීය මවක් හා ගෘහණියකි. 2018 සැප්තැම්බර් මස සිල්වරීන් මයික්‍රෝ ක්‍රෙඩිට් සමාගමේ කෑගල්ල ප්‍රාදේශිකයෙන් සාමාජිකත්වයට බැඳී ‘සවිය’ ස්වයංරැකියා ණය මුදල ලෙස රුපියල් 30,000.00 ක් ලබාගන්නා ලදි.

ගෘහණියකගේ කටයුතු මැනවින් සිදුකලද නිවසේ ආර්ථිකය සඳහා දායකත්වයක් ලබානොදුන් ඇය 2019 මැයි මස 20 දින සිල්වරීන් පුහුණු අංශය විසින් පැවැත්වූ ස්වයංරැකියා පුහුණුව සඳහා සම්බන්ධ වූයේ ස්වයංරැකියාවක් පිළිබඳ පැහැදිළි හෝ නිසි අදහසක් නොමැතිවය.

කෙසේ නමුත් සිල්වරීන් ස්වයංරැකියා පුහුණුව නිසාවෙන් ඇය ස්වයංරැකියාවක් ආරම්භ කර තම සැමියාට ශක්තියක් වීමට අදිටන් කරගන්නා ලදි.

ව්‍යවසායකත්ව විභවයන් ඇති බොහෝ ග්‍රාමීය කාන්තාවන් මුළුගැන්වී ඇත්තේ තමා පිළිබඳ විශ්වාසයක් නොමැතිකම වැනි සෘණාත්මක ආකල්ප නිසාවෙනි. එනිසා සිල්වරීන් පුහුණු වැඩපිළිවෙල තුල මුලින්ම සිදුකරනු ලබන්නේ ආකල්ප සංවර්ධනයයි. පසුව එකිනෙකාගේ විශේෂත්වයන් අනුව සුදුසු ස්වයංරැකියාවක් තෝරාගැනීමට හැකිවන පරිදි විවිධ නිෂ්පාදන වර්ග සිදුකිරීමට ප්‍රායෝගික පුහුණුව ලබාදේ. අපරටේ ග්‍රාමීය කර්මාන්ත අවසනාවන්ත ලෙස වසාදැමීමට ඉවහල් වන ප්‍රබල කාරණාවක් වන්නේ වෙළඳපොළ පිළිබඳ ගැටළුවයි. එම නිසා සිල්වරීන් පුහුණුව ප්‍රායෝගික වෙළඳපොල හැකියා වර්ධන වැඩසටහන් වලට සහභාගි වීමට සාමාජිකාවන්ට අවස්ථාව ලබාදේ. අනතුරුව ව්‍යාපාරයේ සාර්ථක වර්ධනය සඳහා ව්‍යවසායකත්ව හැකියා වර්ධනය හා මුල්‍ය සාක්ෂරතා උපදේශනය ලබාදේ.

ඉනෝකා දිසානායක මහත්මිය, ස්වයංරැකියාවක් පිළිබඳ පැහැදිළි නිසි අදහසක් නොමැතිව වුවද තම සැමියාට ශක්තියක් වීමේ අදිටනින් සම්න්ධ වූයේ ඉහත කී සැලසුම් සහගත සිල්වරීන් පුහුණු වැඩපිළිවෙල සමඟයි.



ඇය 2019 ජූනි 5 දින කෑම ව්‍යාපාරයක් (සමෝසා හා වඩේ) ආරම්භ කලේ සිල්වරීන් පුහුනු කළමනාකරු නාමල් දිසානායක මහතාගේ පූර්ණ මඟපෙන්වීමෙනි. පවුලේ සාමාජිකයන්ද සමගිව කෑම ව්‍යාපාරයට දායක වූයේ දැඩි අධිෂ්ඨානයෙනි.

2019 ජූනි 18 දින ගලිගමුව අඹන්පිටිය හංදියේ කුඩා කඩයක් සකසා කෑම ව්‍යාපාරය විධිමත්ව සිදුකිරීමට පටන් ගන්නා ලදි. ඉනෝකා දිසානායක මහත්මියගේ උද්යෝගි බව අගයකරමින් හා ව්‍යාපාර කටයුතු වර්ධනය කිරීමේ අදහසින් සිල්වරීන් ආයතනය විසින් ලබාදුන් විශාල ප්‍රමාණයේ කුඩයක්, නාම පුවරුවක් හා මේසයක් ආදී උපකරණද ව්‍යාපාරයට යොදා තවදුරටත් ව්‍යාපාර කටයුතු හොඳින් සිදුකරගෙන යන ලදි.

කෑම ව්‍යාපාරයට ක්‍රම ක්‍රමයෙන් නොයෙකුත් සිල්ලර බඩු වෙළඳාමද එක් කරගැනීම නිසා කෑම හා සිල්ලර බඩු වෙළඳසැලක් බවට ව්‍යාපාරය වර්ධනය විය. වර්තමානය වන විට එය අංග සම්පූර්ණ කුඩා කෑම හා සිල්ලර වෙළඳ ව්‍යාපාරයකි. ඉනෝකා දිසානායක තමන් ගෘහණියක ලෙස කටයුතු හොඳින් සිදුකරන අතරේ නිවසේ ආර්ථිකයට ශක්තියක් වන ව්‍යාපාරයක් අරඹා එය පවුලේ දායකත්වයද සමඟින් එය සාර්ථකව වර්ධනය කරගෙන ඇත. මෙම සිදුවීම තවමත් එලෙස නොසිතූ ගෘහණියන්ට ආදර්ශයකි. සිල්වරීන් ආයතනය විසින් නිසි මඟපෙන්වීම හා සමීප දිරිදීම නිසා මෙලෙස ව්‍යවසායකයින් බවට පත්වී සිටින ගෘහණියන් සමාජයේ තව බොහෝ සිටී. සිල්වරීන් පුහුණු අංශයේ අභිලාශය වන්නේ, ඉනෝකා දිසානායක වැනි තවත් ගෘහනියන් ව්‍යවසායකයින් ලෙස නඟා සිටුවීමයි.



### සිල්වරීන් පුහුණු කළමනාකරු නාමල් දිසානායක මහතාගේ අදහස්

ඉනෝකා දිසානායක මහත්මිය මාහට හමුවූ මුල් අවධියේ ඇයගේ අදහස් බහුතර ගෘහණියන්ගේ අදහස් වලට සමාන වූ බව මට මතකයි. නමුත් අපගේ පුහුණු අංශය මඟින් දියත් කරන වැඩපිළිවෙල සමඟ සංවර්ධනය වී ඇති බොහොමයක් සාමාජිකාවන් පරිද්දෙන්ම ඉනෝකා මහත්මියද පියවරෙන් පියවර සංවර්ධනය වූවා.

ඇයගේ සාර්ථකත්වයට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස මා දකින්නේ, අපේ උපදෙස් ආරම්භයේ සිට අද දක්වාම නිසි පරිදි පිළිපැදීමයි. දැන් ඇය හොඳින්ම දන්නවා පාරිබෝගිකයාට අවංකව ගුණාත්මක දේ ලබාදීමේ වැදගත්කම, ඒ වගේම අනිසි ලාභ ලැබීමට වඩා පාරිබෝගිකයා රැකගෙන පියවරින් පියවර දියුණු වීමේ වටිනාකම. ඇයගේ කැපවීම හොඳයි, ව්‍යපාරය ගැන තිබෙන ඇල්ම අගය කළ යුතුමයි, ඇගේ නිවසේ සාමාජිකයන්ගේ අවබෝධය හා දායකත්වය හොඳ මට්ටමක තිබෙනවා. එනිසා ඇය හොඳ ගමනක් යන බව මට විශ්වාසයි.

### ස්වයංරැකියා පුහුණුලාභී ඉනෝකා දිසානායක මහත්මියගේ අදහස්



ඇත්තෙන්ම ව්‍යාපාරයක් පටන් ගන්න මට අදහසක් තිබුනේ නෑ. සිල්වරීන් පුහුණු වැඩමුළුව නිසා තමයි අදහසක් උපන්නේ. ඒත් මම හිතුවේ පටන් ගන්න බැරි වේවි කියලා. නාමල් දිසානායක මහත්තයා දුන්නු ධෛර්යය ගොඩාක් උදව් උනා මේ ව්‍යාපාරය පටන් ගන්න.

පවුලේ අපි එකතු වෙලා ටිකෙන් ටික කෑම ව්‍යාපාරය වැඩිදියුණු කරගනිද්දී ලොකු ආශාවක් ඇතිවුනා. හැමෝම හොඳ කියනකොට උනන්දුව වැඩි උනා.

විශේෂයෙන්ම ව්‍යාපාරය පටන් ගත්තට පස්සේ නාමල් දිසානායක මහත්තයා නිතර නිතර ඇවිත් උපදෙස් ලබාදුන්නා, අළුත් අදහස් ලබාදුන්නා, මුදල් ඉතිරිකරන ක්‍රම කියලා දුන්නා, ණය උගුලට හසුනොවී කටයුතු කරන්න කියලා දුන්නා. ව්‍යාපාරය හොඳින් කෙරෙන නිසා තව අවශ්‍ය උපකරණ කිහිපයකුත් ලබාදුන්නා. මේ හැමදේම නොමිලේ ලබාදෙන සේවාවන්. එනිසා සිල්වරීන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා නාමල් දිසානායක මහතාට මම ස්තූතිවන්ත වෙනවා වගේම තවත් මා වැනි අයට දිරි දෙන්නට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.




මම හැමෝටම කියන්න කැමති දෙයක් තියෙනවා, අපි හිතන්නේ අපිට යමක් පටන් ගත්තම බාධා කරන අය ඉන්න නිසා කිසි දෙයක් සාර්ථක කරගන්න බෑ කියලා. ඒ උනාට මෙහෙම දේවල් වලට උදව් කරන්නත් මිනිසුන් ඉන්නවා කියලා දැනෙන්නේ දෙයක් පටන් ගත්තම. එනිසා බය නොවී පටන් ගන්න. අභියෝග වලට මුහුණු දෙන්න අපිට ශක්තිය තියෙනවා. ඒ ශක්තිය උරගාලා බලන්න ඕනේ.